# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE



මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: CGO/ASM/Policy/Cir/ (VOL II)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 04.12.2019

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2019**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය - මෝටර් රථ වාහන භාවිතය**

රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව රජයේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති 2019 දෙසැම්බර් 02 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/4/2019 දරණ චක්‍රලේඛය අනුව, රජයේ මෝටර් වාහන භාවිතය කලමනාකරණය විධිමත් කිරීම තහවුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි කටයුතු කල යුතු බව අවධාරණය කරමි.

02. ඉහත චක්‍රලේඛය පරිදි අදාල මෝටර් වාහන කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත භාරදීමට ප්‍රථම එම මෝටර් වාහන පිළිබඳ තොරතුරු ඇමුණුම I හි සඳහන් ආකෘතිය අනුව ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු අතර එම තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු අදාල වාහන භාර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා දන්වනු ලැබේ.

03. තවද, ඔබගේ අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන සතු මෝටර් වාහන පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි 2019 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කර 2020 ජනවාරි 15 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු වේ.

i. ජනාධිපති ලේකම්ගේ 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරණ චක්‍රලේඛය අනුව නව අමාත්‍යවරුන් සහ කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇති වාහන පිළිබඳ තොරතුරු ඇමුණුම II හි සඳහන් ආකෘතිය අනුව

ii. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත මණ්ඩල සතු මෝටර් වාහන පිළිබඳ තොරතුරු 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව

04. මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

**එස්.ආර්. ආටිගල**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

## Annexure - I

| Name of the Ministry | Motor Vehicle Registration Number | Method of Acquired(Outright/Financial Leasing/Operational Leasing/Other (please specify) | Type of Vehicle (SUV, Car, Double Cab, Van) | Make & Model | Year of Manufacture | Details of Previous Usage of Vehicle | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | Ministry | To Whom Assigned | |
| | | | | | | | Name | Position |
| | | | | | | | | |

## Annexure - II

| Name of the Ministry | Motor Vehicle Registration Number | Method of Acquired(Outright/Financial Leasing/Operational Leasing/Other (please specify) | Type of Vehicle (SUV, Car, Double Cab, Van) | Make & Model | Year of Manufacture | To Whom Assinged | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | Name | Position |
| | | | | | | | |